සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

89787

**21 S I**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2004 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2004 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2004

ආර්ථික විද්‍යාව I (I කොටස)
பொருளியல் I (பகுதி I)
Economics I (Part I)

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour


විභාග අංකය : ........................................

සැලකිය යුතුයි :

* මෙම කොටසේ ප්‍රශ්න 20 ක් ඇත. ඒ සියලු ප්‍රශ්න අනිවාර්ය වේ.
* එක් ප්‍රශ්නයකට ලකුණු 02 ක් ලැබෙන අතර, මුළු කොටසට ලකුණු 40 ක් හිමි වේ.
* එක් බහුවරණ ප්‍රශ්නයකට ඇත්තේ එක් නිවැරදි පිළිතුරක් පමණි. එම පිළිතුර හඳුනාගෙන පිළිතුරට යටින් ඉරක් අඳින්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතුයි.
* නියමිත කාලය අවසන් වූ විට I හා II කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා ශාලාධිපතිට භාර දිය යුතුයි.

---

1. පහත සඳහන් රූප සටහනෙන් ප්‍රාග්ධන හා පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය කෙරෙන ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් පෙන්නුම් කෙරේ.
මෙම ආර්ථිකය තම නිෂ්පාදන මට්ටම X ලක්ෂ්‍යයෙහි සිට Y ලක්ෂ්‍යය දක්වා විතැන් කරනු ලැබුවහොත්




   (i) ප්‍රාග්ධන භාණ්ඩ ඒකක 70 ක ආවස්ථික පිරිවැයක් ඇති වේ.
   (ii) පාරිභෝගික භාණ්ඩ ඒකක 250 ක ආවස්ථික පිරිවැයක් ඇති වේ.
   (iii) සේවා නියුක්තියෙහි වැඩිවීමක් සිදු වේ.
   (iv) ආවස්ථික පිරිවැයක් ඇති නොවේ.
   (v) පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදන අංශය වෙතින් ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදන අංශය කරා සම්පත් මාරුවීමක් සිදු වේ.

2. මිශ්‍ර ආර්ථික ක්‍රමයක් යන්න නිර්වචනය කළ හැක්කේ
   (i) පාරිභෝගික හා නිෂ්පාදක යන දෙපාර්ශවයේ ම අවශ්‍යතා සපුරාගැනීමට හැකිවන ලෙස සම්පත් බෙදා වෙන්කරන ක්‍රමයක් ලෙසිනි.
   (ii) සම්පත්වලින් කොටසක් පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනයට ද අනෙක් කොටස ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනයට ද භාවිත කෙරෙන ක්‍රමයක් ලෙසිනි.
   (iii) සම්පත්වලින් කොටසක් වෙළෙඳ පොළ බලවේග මගින් ද අනෙක් කොටස රාජ්‍ය අංශය මගින් ද බෙදා වෙන් කරන ක්‍රමයක් ලෙසිනි.
   (iv) හුදෙක් ව්‍යවසායකයන්ගේ වියදම් තීරණ මත සම්පත් බෙදා වෙන්කරන ක්‍රමයක් ලෙසිනි.
   (v) හුදෙක් පාරිභෝගිකයන්ගේ වියදම් තීරණ මත සම්පත් බෙදා වෙන්කරන ක්‍රමයක් ලෙසිනි.

3. පාරිභෝගික ඉල්ලුම් වක්‍රයක් අඳින විට පහත සඳහන් කරුණු අතුරෙන් ස්ථාවර ව නොපවතින බවට උපකල්පනය කෙරෙනුයේ කුමක් ද?
   (i) සලකා බලනු ලබන භාණ්ඩයේ මිල
   (ii) අනුපූරක භාණ්ඩයන්හි මිල
   (iii) ආදේශක භාණ්ඩයන්හි මිල
   (iv) නිෂ්පාදන සාධක මිල
   (v) පාරිභෝගික ආදායම

[ දෙවැනි පිටුව බලන්න

4. වෙළෙඳ පොළ අසාර්ථක වීමක් යනු
   (i) ඉල්ලුම, සැපයුමට සමාන නොවන තත්ත්වයකි.
   (ii) වෙළෙඳ පොළ බලවේග මගින් සම්පත් කාර්යක්ෂමව බෙදා නොහරිනු ලබන තත්ත්වයකි.
   (iii) කර්මාන්තයෙන් ආයතන ඉවත්වීම නිසා හටගන්නා තත්ත්වයකි.
   (iv) මධ්‍යගත සැලසුම් සහිත ආර්ථික ක්‍රමයක් තුළ පමණක් දක්නට ලැබෙන තත්ත්වයකි.
   (v) රජය විසින් වෙළෙඳ පොළ සමතුලිතයට වඩා වැඩි මිලක් නියම කරනු ලැබීම නිසා පැනනගින තත්ත්වයකි.


5. පරිගණකවල මිල පහළ බැසීම මෘදුකාංග (Software) වෙළෙඳ පොළ තුළ කවර බලපෑමක් ඇතිකරනු ලැබේ ද?
   (i) ඉල්ලුමෙහි වැඩිවීමක් .
   (ii) සැපයුමෙහි වැඩිවීමක්
   (iii) ඉල්ලුමෙහි අඩුවීමක්
   (iv) සැපයුමෙහි අඩුවීමක්
   (v) ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයෙහි වැඩිවීමක්

6. නම්‍ය ඉල්ලුමක් හා අනම්‍ය සැපයුමක් පවතින වෙළෙඳ පොළක් මත බද්දක් පනවනු ලැබුවහොත්,
   (i) බදුබරින් වැඩි කොටසක් ගැනුම්කරුවෝ දරති.
   (ii) බදුබර මුලුමනින් ම ගැනුම්කරුවෝ දරති.
   (iii) බදුබරින් වැඩි කොටසක් අලෙවිකරුවෝ දරති.
   (iv) ගැනුම්කරුවෝ සහ අලෙවිකරුවෝ සමසම ව බදුබර දරති.
   (v) බදුබර දෙපිරිස අතර බෙදන ආකාරය නිර්ණය කළ නොහැකි ය.

7. කිසියම් භාණ්ඩයක මිල වෙනස්වීමක් මුළු අයභාරයෙහි වෙනසක් ඇති කරනු නො ලැබේ නම්
   (i) එම භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම නම්‍ය විය යුතු ය.
   (ii) එම භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම අනම්‍ය විය යුතු ය.
   (iii) මිල වෙනස්වීම කෙරෙහි ගැනුම්කරුවන් දැඩි ප්‍රතිචාරයක් නො දැක්විය යුතු ය.
   (iv) භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම ඒකීය නම්‍ය විය යුතු ය.
   (v) භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම ශූන්‍ය නම්‍ය විය යුතු ය.

8. ඉල්ලුම් වක්‍රයෙහි විතැන්වීමක් නොමැතිව සහල් මිල ඉහළ යාමට පහත සඳහන් සාධක අතුරෙන් කවර සාධකයක් බලපෑ හැකි ද?
   (i) වී ගොවීන්ගේ ඵලදායිතාවය වැඩිවීමක්
   (ii) පාරිභෝගිකයින්ගේ මූර්ත ආදායමෙහි වැඩිවීමක්
   (iii) කෘෂිකාර්මික කම්කරුවන්ගේ වැටුප් වැඩිවීමක්
   (iv) වී ගොවිතැන සඳහා දෙනු ලබන පොහොර සහනාධාරයෙහි වැඩිවීමක්
   (v) සහල් ප්‍රධාන ආහාරය වශයෙන් භාවිතයට ගැනෙන මුළු ජනගහනයේ වැඩිවීමක්

9. පහත සඳහන් රූප සටහනෙහි දැක්වෙන ආකාරයට ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය නගා සිටුවීම සඳහා සහනාධාරයක් ලබාදීමට රජය තීරණය කරනු ලැබීයැ යි සිතන්න.




සහනාධාරය සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය හඳුනාගන්න.


(i) $P_2P_3MY$  (ii) $OP_2YQ_2$  (iii) $OP_1XQ_2$  (iv) $OP_3MQ_2$  (v) $P_1P_3MX$

[ තුන්වෙනි පිටුව බලන්න

www.pastpaperlk.com
www.artsapi.lk

10. පහත සඳහන් රූප සටහනෙහි වී සඳහා ඇති සැපයුම් වක්‍රය $S_1S_1$ වලින් ද ඉල්ලුම් වක්‍රය DD වලින් ද පෙන්නුම් කරන අතර වර්තමානයෙහි වී වෙළෙඳ පොළ සමතුලිතය E ලක්ෂ්‍යයෙන් පිලිබිඹු කෙරේ. මේ අතර රජය වී සඳහා $OP_2$ අවම සහතික මිලක් නියම කර කිසියම් අතිරික්ත වී නිෂ්පාදනයක් ඇත්නම් එම මිලට එයද මිල දී ගන්නා බවට තහවුරු කරයි. ඊළඟ වර්ෂයේ දී වී නිෂ්පාදනය වැඩි වන අතර රූප සටහනෙහි දක්වෙන අන්දමට සැපයුම් වක්‍රය $S_2S_2$ දක්වා විතැන් වේ.
වැඩි වූ නිෂ්පාදන තත්ත්වය යටතේ රජයට ගොවීන්ගෙන් මිල දී ගැනීමට සිදුවන වී ප්‍රමාණය කොපමණ ද?

(i) $Q_3$ සිට $Q_4$ දක්වා
(ii) $Q_2$ සිට $Q_3$ දක්වා
(iii) $Q_2$ සිට $Q_4$ දක්වා
(iv) $Q_1$ සිට $Q_3$ දක්වා
(v) $Q_1$ සිට $Q_4$ දක්වා





11. ආදායම අඩු වන විට A භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය වැඩි වේ නම්,
(i) A අනුපූරක භාණ්ඩයකි.
(ii) A ආදේශක භාණ්ඩයකි.
(iii) A සාමාන්‍ය භාණ්ඩයකි.
(iv) A බාල භාණ්ඩයකි.
(v) A අනම්‍ය භාණ්ඩයකි.

12. පූර්ණ තරගකාරී කර්මාන්තයක් තුළ තනි නිෂ්පාදන ආයතනයක් මුහුණදෙන ඉල්ලුම් වක්‍රයෙහි නම්‍යතාවය
(i) ශූන්‍ය වේ, මක්නිසාදයත් ආයතනය නිෂ්පාදනය කරනුයේ තමන්ට ම සුවිශේෂී වූ භාණ්ඩයක් වන බැවිනි.
(ii) ශූන්‍ය වේ, මක්නිසාදයත් බොහෝ ආයතන නිෂ්පාදනය කරනුයේ සමජාතීය භාණ්ඩ වන බැවිනි.
(iii) අපරිමිත වේ, මක්නිසාදයත් ආයතනය නිෂ්පාදනය කරනුයේ තමන්ට ම සුවිශේෂී වූ භාණ්ඩයක් වන බැවිනි.
(iv) අපරිමිත වේ, මක්නිසාදයත් බොහෝ ආයතන නිෂ්පාදනය කරනුයේ සමජාතීය භාණ්ඩ වන බැවිනි.
(v) ශූන්‍යයේ සිට අපරිමිතය දක්වා වෙනස් වේ. මක්නිසාදයත් කර්මාන්තය තුළ ආයතන විශාල සංඛ්‍යාවක් සිටින බැවිනි.

13. කිසියම් නිෂ්පාදන මට්ටමක දී ආයතනයක් සැමවිට ම නිෂ්ප්‍රමාණික ලාභ උපයනුයේ
(i) ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමානවන බැවිනි.
(ii) මුළු අයභාරයට වඩා මුළු පිරිවැය විශාල බැවිනි.
(iii) සාමාන්‍ය පිරිවැයට වඩා සාමාන්‍ය අයභාරය විශාල වන බැවිනි.
(iv) සාමාන්‍ය අයභාරයට වඩා සාමාන්‍ය විචල්‍ය පිරිවැය අඩු බැවිනි.
(v) සාමාන්‍ය පිරිවැය අඩු වෙමින් පවතින බැවිනි.

14. දී ඇති රූප සටහන අනුව සෑම මිලක දී ම කිසියම් භාණ්ඩයක් සඳහා ඇති වෙළෙඳ පොළ ඉල්ලුම් ප්‍රමාණය සැපයුම් ප්‍රමාණයට වඩා අඩු මට්ටමක පවතී. මහජනයා විසින් OQ ඒකක ප්‍රමාණය මිල දී ගත යුතු යැයි රජය සලකන්නේ නම්;




(i) මිල $OP_1$ ප්‍රමාණයට වඩා වැඩි නො විය යුතු යැයි නියෝග කිරීමට සිදු වේ.
(ii) $OP_4$ මිල අය කිරීමට සැපයුම්කරුවන්ට අවසරදීමට සිදු වේ.
(iii) අළෙවි කරන සෑම ඒකකයකට ම $P_2P_3$ නිෂ්පාදන පිහිටාධාරයක් සැපයීමට සිදු වේ.
(iv) අළෙවි කරන සෑම ඒකකයකට ම $P_1P_3$ නිෂ්පාදන පිහිටාධාරයක් සැපයීමට සිදු වේ.
(v) අළෙවි කරන සෑම ඒකකයකට ම $P_1P_4$ නිෂ්පාදන පිහිටාධාරයක් සැපයීමට සිදු වේ.

[ හතරවැනි පිටුව බලන්න

www.pastpaperlk.com
www.artsapi.lk

15. ආර්ථික විද්‍යාත්මක නිර්වචනය අනුව ශුද්ධ ආයෝජනය තුළට ඇතුළත් කළ හැක්කේ පහත සඳහන් දෑ අතුරෙන් කවරක් ද?
   (i) ඖෂධ මිල දී ගැනීම සඳහා රජය දරන වියදම
   (ii) පොදු සීමිත සමාගම්වල කොටස් මිල දී ගැනීම
   (iii) ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මහජනයා සතු ඉතුරුම්
   (iv) යල් පැනගිය උපකරණ නව යන්ත්‍ර සූත්‍ර මගින් ප්‍රතිසම්පාදනය කිරීම
   (v) නව කර්මාන්ත පුරයක් ඉදි කිරීම.

16. පාරිභෝජන ශ්‍රිතය: $C = 0{\cdot}75\,(Y - T) + 100$ ක් ද $T = 50$ වේ නම්, ඉතුරුම් ශ්‍රිතය වනුයේ
   (i) $S = 0{\cdot}75\,(Y - T) - 100$
   (ii) $S = 0{\cdot}75\,(Y - T) + 150$
   (iii) $S = 0{\cdot}25\,(Y - T) - 100$
   (iv) $S = 0{\cdot}25\,(Y - T) - 175$
   (v) $S = -0{\cdot}25\,(Y - T) + 100$

17. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **සාවද්‍ය** ප්‍රකාශය වනුයේ
   (i) $Y = C + I + G + X - M$
   (ii) $I + G + X = S + T + M$
   (iii) $Y = C + I + G + NX$ (NX = ශුද්ධ අපනයන)
   (iv) $Y + M = C + I + G + X$
   (v) $Y = C + S + T$

18. ශුද්ධ පොදු භාණ්ඩයක නෛසර්ගික ලක්ෂණයක් වන්නේ,
   (i) ආවස්ථික පිරිවැයට වඩා අඩු මිලකට රාජ්‍ය අංශය මගින් පමණක් සපයනු ලබන භාණ්ඩයක් වීමයි.
   (ii) වෙළෙඳ පොළ මිලට වඩා අඩු මිලකට පෞද්ගලික අංශය මගින් පමණක් සපයනු ලබන භාණ්ඩයක් වීමයි.
   (iii) වෙළෙඳ පොළ මිලට වඩා අඩු මිලකට පෞද්ගලික හා රාජ්‍ය යන අංශ දෙක මගින් ම සපයනු ලබන භාණ්ඩයක් වීමයි.
   (iv) එක් අයෙකුගේ පරිභෝජනය නිසා අන් අයගේ පරිභෝජනය අහිමි නොවන භාණ්ඩයක් වීමයි.
   (v) නිෂ්පාදනයේ දී ආවස්ථික පිරිවැයක් දැරීමට සිදු නොවන භාණ්ඩයක් වීමයි.

19. පහත සඳහන් දෑ අතුරෙන් සංකෝචනාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ඇඟවෙන්නේ කවරක් තුළින් ද?
   (i) බදු අනුපාතික ඉහළ දැමීමක් සහ රාජ්‍ය වියදම් අඩු කිරීමක්
   (ii) බදු අනුපාතික ඉහළ දැමීමක් සහ පොළී අනුපාතික ඉහළ දැමීමක්
   (iii) බදු අනුපාතික පහළ දැමීමක් සහ රාජ්‍ය වියදම් ඉහළ දැමීමක්
   (iv) රාජ්‍ය වියදම් අඩු කිරීමක් සහ පොළී අනුපාතික ඉහළ දැමීමක්
   (v) අයවැය හිඟය වැඩි කිරීමක් සහ එම හිඟය විදේශීය ණය ලබා ගැනීම මගින් පියවීමක්

20. ඉල්ලුම් න්‍යායෙන් ප්‍රකාශ වන්නේ,
   (i) කිසියම් භාණ්ඩයක මිල සහ එම භාණ්ඩය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධතාවක් පවතින බව ය.
   (ii) කිසියම් භාණ්ඩයක මිල සහ එම භාණ්ඩය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් පවතින බව ය.
   (iii) ඉල්ලුම වැඩිවීමෙන් මිල සහ ප්‍රමාණය ඉහළ යාමක් සිදුවන බව ය.
   (iv) ඉල්ලුම අඩුවීමෙන් මිල සහ ප්‍රමාණය අඩුවීමක් සිදුවන බව ය.
   (v) ඉහත සඳහන් (iii) සහ (iv) ප්‍රකාශ දෙක ම බව ය.

* *

www.pastpaperlk.com www.artsapi.lk

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 | S | I**

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2004 අප්‍රේල්
## கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2004 ஏப்பிரல்
## General Certificate of Education (Adv. Level) Examination, April 2004

**ආර්ථික විද්‍යාව I (II කොටස)**
**பொருளியல் I (பகுதி II)**
**Economics I (Part II)**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

* "අ" උප කොටසින් ප්‍රශ්න **දෙකක්** ද,
"ආ" උප කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

---

### "අ" උප කොටස
(මෙම කොටසින් ප්‍රශ්න **දෙකක්** තෝරාගන්න.)

**1.** කිසියම් රටක්, මෝටර් රථ සහ පරිගණක යන භාණ්ඩ සංයෝජනය නිෂ්පාදනය කරමින් වැඩිවන ආවස්ථික පිරිවැය සහිත නිෂ්පාදන හැකියා වක්‍රයක් මත ලක්ෂ්‍යයක සිටී. තිරස් අක්ෂයෙහි මෝටර් රථ සහ සිරස් අක්ෂයෙහි පරිගණක දක්වෙන සේ අඳින ලද එම නිෂ්පාදන හැකියා වක්‍රයට පහත සඳහන් දෑ කරන බලපෑම හේතු සහිත ව වෙන් වෙන් වශයෙන් රූප සටහන් මගින් පෙන්නුම් කරන්න.

(i) එම රටින් විශාල ප්‍රමාණයක පුහුණු පරිගණක ශිල්පීන්ගේ ශුද්ධ බාහිර සංක්‍රමණයක් (net out-migration) සිදුවිය. *(ලකුණු 03 යි)*

(ii) පරිගණක නිෂ්පාදන අංශයේ සේවකයන්ගේ ඵලදායිතාවේ සහළ වැඩිමක් සිදුවුවත් පරිගණක හා මෝටර් රථ කර්මාන්ත දෙකෙන් එකකවත් සේවානියුක්තියේ වෙනසක් සිදු නොවීය. *(ලකුණු 03 යි)*

(iii) මෝටර් රථ නිෂ්පාදන අංශයේ හටගත් තාක්ෂණික දියුණුවක් නිසා එම අංශයෙහි විරැකියා තත්ත්වයක් ඇතිවිය. එහෙත් පරිගණක නිෂ්පාදන අංශයට එමගින් කිසිදු බලපෑමක් ඇති නොවීය. *(ලකුණු 03 යි)*

(iv) ඉල්ලුම අඩු වීම නිසා මෝටර් රථ නිෂ්පාදන අංශයෙහි විරැකියා තත්ත්වයක් ඇතිවිය. එහෙත් පරිගණක සඳහා ඉල්ලුමෙහි කිසිදු වෙනසක් සිදු නොවීය. *(ලකුණු 03 යි)*

(v) පරිගණක සඳහා ඉල්ලුම වැඩි වූ අතර මෝටර් රථ සඳහා ඉල්ලුම අඩු විය. එහෙත් කර්මාන්ත දෙකේ ම සේවා නියුක්තියේ කිසිදු වෙනසක් සිදු නොවීය. *(ලකුණු 03 යි)*


**2.** (i) වෙළෙඳ පොළ ආර්ථිකයක් තුළ මිලෙහි කාර්යයන් කවරේ ද? *(ලකුණු 04 යි)*

(ii) සැලසුම්ගත ආර්ථික ක්‍රමයක වාසි සහ අවාසි සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*

(iii) නිදහස් වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමයක් තුළ රජයේ මැදිහත්වීම් සාධාරණීකරණය කළ හැක්කේ කවර හේතු නිසා ද? *(ලකුණු 04 යි)*

(iv) ආර්ථික ලාභ, ගණකාධිකරණ ලාභවලින් වෙනස්වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*

**3.** නිෂ්පාදකයන් මත ඒකක බද්දක් පැනවීම නිසා ඇති වන ප්‍රතිවිපාක පහත දක්වෙන රූප සටහනෙන් පෙන්නුම් කෙරේ. එය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) බද්දට පෙර සහ බද්දට පසු සමතුලිත මිල සහ ප්‍රමාණය කවරේ ද? *(ලකුණු 02 යි)*

(ii) පාරිභෝගිකයන් විසින් දරනු ලබන මුළු බදු මුදල කොපමණ ද? *(ලකුණු 02 යි)*

(iii) බද්ද පැනවූ පසු අය කරගත හැකි මුළු බදු ආදායම කොපමණ ද? *(ලකුණු 03 යි)*

(iv) වෙළෙඳ පොළ සමතුලිතව පවතින විට බද්දට පෙර නිෂ්පාදක අතිරික්තය කොපමණ ද? බද්දට පසු නිෂ්පාදක අතිරික්තය කොපමණ ද? *(ලකුණු 04 යි)*

(v) වෙළෙඳ පොළ සමතුලිතව පවතින විට බද්දට පෙර පාරිභෝගික අතිරික්තය කොපමණ ද? බද්දට පසු පාරිභෝගික අතිරික්තය කොපමණ ද? *(ලකුණු 04 යි)*

[දෙවැනි පිටුව බලන්න

www.pastpaperlk.com
www.artsapi.lk

4. වෙළෙඳ පොළ සමීක්ෂණයක දී X භාණ්ඩයට ඇති ඉල්ලුම පිළිබඳ ව පහත සඳහන් තොරතුරු ලබාගෙන ඇතැයි සලකන්න.

(අ) X භාණ්ඩයේ මිල 25% කින් වැඩි වන විට X භාණ්ඩයෙන් අළෙවි වන ප්‍රමාණය 5% කින් අඩු වේ.
(ආ) පාරිභෝගික ආදායම 4% කින් වැඩි වන විට X භාණ්ඩයෙන් අළෙවි වන ප්‍රමාණය 8% කින් වැඩි වේ.
(ඇ) Y භාණ්ඩයෙහි මිල 1% කින් වැඩි වන විට X භාණ්ඩයෙන් අළෙවි වන ප්‍රමාණය 5% කින් අඩු වේ.

ඉහත සඳහන් තොරතුරු පදනම් කර ගනිමින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) X භාණ්ඩයෙහි ආදායම් ඉල්ලුම් නම්‍යතාව කොපමණ ද? (ලකුණු 03 යි)
(ii) X භාණ්ඩයෙහි මිල ඉල්ලුම් නම්‍යතාව කොපමණ ද? (ලකුණු 03 යි)
(iii) Y භාණ්ඩයට සාපේක්ෂව X භාණ්ඩයෙහි හරස් මිල ඉල්ලුම් නම්‍යතාව කොපමණ ද? (ලකුණු 03 යි)
(iv) X භාණ්ඩය, Y භාණ්ඩයේ ආදේශකයක් වේ ද? නොඑසේ නම් අනුපූරක භාණ්ඩයක් වේ ද? (ලකුණු 03 යි)
(v) X භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම නම්‍ය ද, අනම්‍ය ද? (ලකුණු 03 යි)

"ආ" උප කොටස
(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරාගන්න.)

5. දෙන ලද වර්ෂයක් සඳහා කිසියම් ආර්ථිකයක ජාතික ගිණුම් පිළිබඳ දත්ත පහත දැක්වේ. (සංඛ්‍යා රු. බිලියන වලිනි.)

| | |
|---|---|
| පෞද්ගලික පරිභෝජනය | 450 |
| ශ්‍රමිකයන්ගේ ඉපයීම් | 375 |
| අපනයන | 120 |
| ශුද්ධ විදේශ සාධක ආදයම් | 30 |
| රජයේ මිල දී ගැනීම් | 60 |
| දළ ආයෝජන | 100 |
| ආනයන | 160 |
| ශුද්ධ වක්‍ර බදු | 15 |
| ශුද්ධ පොලී | 60 |
| ලාභ | 70 |
| බදු කුලී ආදයම් | 40 |
| කුටුම්බ සඳහා සංක්‍රාම ගෙවීම් | 5 |
| පෞද්ගලික බදු | 20 |

(i) (අ) දළ ජාතික නිෂ්පාදිතය (ආ) දළ දේශීය නිෂ්පාදිතය (ඇ) ශුද්ධ දේශීය නිෂ්පාදිතය
(ඊ) ජාතික ආදයම හා (උ) වැය කළ හැකි පෞද්ගලික ආදයම ගණනය කරන්න. (ලකුණු 02 බැගින්)
(ii) අදළ වර්ෂයේ ක්ෂයවීම්වල ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02 යි)
(iii) ශ්‍රී ලංකාවේ කුටුම්බ සඳහා රජයෙන් සපයනු ලබන සංක්‍රාම ගෙවීම් තුළ අන්තර්ගත ප්‍රධාන දෑ සඳහන් කරන්න. (ලකුණු 03 යි)

6. (i) ආන්තික පරිභෝජන නැඹියාවේ හා ආන්තික ඉතුරුම් නැඹියාවේ ඓක්‍යය සැමවිට ම 1 ට සමාන වන්නේ ඇයි? (ලකුණු 03 යි)
(ii) දළ දේශීය නිෂ්පාදිතය සඳහා ගණනය නොකෙරෙන සහ ඒ නිසා ම ඒ තුළ අන්තර්ගත නොවන එලදයි ආර්ථික ක්‍රියාවන් කවරේ ද? (ලකුණු 04 යි)
(iii) විවෘත ආර්ථිකයක ආදායමේ වෘත්ත ප්‍රවාහ ආකෘතියක ඇතුළත් "විදීම්" සහ "කාන්දුවීම්" යන්නෙන් කුමක් අදහස් වේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(iv) රාජ්‍ය අංශයකින් තොර සංවෘත ආර්ථිකයක ආන්තික පරිභෝජන නැඹියාවේ අගය 0·8 ඝ. රුපියල් බිලියන 100 කින් ආයෝජන වියදම් වැඩිවීමක් නිසා ප්‍රථම වට හතර තුළ හටගන්නා ගුණක ප්‍රතිඵල ගණනය කරන්න. (ලකුණු 04 යි)

7. (i) බාහිරතා යන්නෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 04 යි)
(ii) පෞද්ගලික පිරිවැය සහ සමාජයීය පිරිවැය අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)
(iii) ධන බාහිරතා සහිත ආර්ථික ක්‍රියාවන් දෙකක් සඳහා උදහරණ සපයන්න. (ලකුණු 02 යි)
(iv) බාහිර ප්‍රතිලාභ ජනනය කෙරෙන ආර්ථික ක්‍රියාවක් නිසා නිදහස් වෙළෙඳ පොළ බලවේග මත තීරණය වන නිමැවුම් මට්ටම සහ සමාජයීය වශයෙන් කාර්යක්ෂම නිමැවුම් මට්ටම අතර පවත්නා වෙනස යෝග්‍ය ප්‍රස්තාර සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

8. "පසුගිය දස වසර තුළ සමස්ත අයවැය හිඟයේ සාමාන්‍යය, දළ දේශීය නිෂ්පාදිතයෙන් 9% වේ."
(ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව 2002)

(i) වර්ෂ 1990 ට පසු ශ්‍රී ලංකාවේ විශාල අයවැය හිඟයක් ඇතිවීමට බලපෑ ප්‍රධාන හේතු කවරේ ද? (ලකුණු 05 යි)
(ii) විශාල අයවැය හිඟයන්හි ආර්ථික පිරිවැය විමසන්න. (ලකුණු 05 යි)
(iii) මෑත වර්ෂවල රාජ්‍ය මූල්‍ය විනය ස්ථාපිත කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රධාන ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 05 යි)

* * *

www.pastpaperlk.com www.artsapi.lk